**2019 මුදල් වර්ෂය සඳහා**
**ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ**

# කාර්ය සාධන වාර්තාව

**2019 ஆம் ஆண்டிற்கான**
காணி உரித்து நிருணய ஆணையாளர் நாயகத்தின்

# செயல் இலக்கு அறிக்கை

# PERFORMANCE REPORT

**of the Commissioner General of Land Title Settlement**
**for the Financial Year 2019**

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
காணி உரித்து நிர்ணயத் திணைக்களம்
**LAND TITLE SETTLEMENT DEPARTMENT**

# ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්වරයාගේ පණිවිඩය

1998 සිට මේ දක්වා වන වසර 21 ක කාලය තුළ ලද අත්දැකීම්, උගත් පාඩම් හා ඉටු කර ඇති කාර්යය සමාලෝචනය කර මඟ සකස් කර ගැනීමට සුදුසු අවධිය එළඹ ඇතැයි සිතමි.

පෙර අනුමත වූ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත්වලට වඩා වැඩි කාලයක් 1998 අංක 21 දරණ පනත ක්‍රියාත්මක වී ඇත. වසර 15කදී දිවයිනම මැන හිමිකම් නිරවුල් කිරීමේ අභිප්‍රායෙන් සංඛ්‍යාත්මකව ගණන් බලන ලද කාර්ය මණ්ඩලයක් අනුමත කර ගන්නා ලද නමුත් එම සංඛ්‍යා කිසි දිනෙක ලැබී නැත. දිවයින පුරා පිහිටි කාර්යාල ක්‍රමයක් මධ්‍යගතව අධීක්ෂණය හා මෙහෙයවීම කෙතෙක් දුරට ප්‍රායෝගිකද යන්න සලකා බලා ඒ අනුව ඉදිරි කටයුතු සැලසුම් කිරීම වඩාත් උචිත වනු ඇත. මැනුම් කරනු ලබන ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් හිමිකම් නිරවුල් කිරීමේ ප්‍රතිශතාත්මක වර්ධනයක් පැවතිය ද වසර 21ක් ගතවන විටත් දිවයිනේ ඉඩම් කැබලි මිලියන 12ක් අතුරින් මැනීමට හැකිව ඇත්තේ මිලියන 1.35ක් පමණක් බවත් හිමිකම් නිරවුල් කර ඇත්තේ මිලියන 0.78ක් පමණක් බවත් ලක්ෂ 2ක පමණ ප්‍රමාණයක් විවිධ හේතු නිසා තීරණදීමට නොහැකි තත්ත්වයක පවතින ආකාරයත් සලකන විට සමස්ත හිමිකම් නිරවුල් කිරීමේ වැඩ සටහනත් එහි නීතියේ ප්‍රායෝගිකභාවය, ආයතනික ව්‍යුහය, ක්‍රමෝපායන් හා ආයතනික ක්‍රියාකාරිත්වයත් නැවත සමාලෝචනය ඉතා අවශ්‍ය බව පෙනේ.

කෙසේ වුවද 1998 සිට මේ දක්වා දෙපාර්තමේන්තුව වශයෙන් ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ලබා ගෙන ඇති සමස්ත ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි අතර මේ සඳහා විවිධ බාහිර මෙන්ම අභ්‍යන්තර හේතූන්ද ප්‍රමුඛතා වෙනස් වීම, පනතේ දුර්වලතා, අපේක්ෂිත කාර්ය මණ්ඩලයක් නොලැබීමද, හිමිකම් නිරවුල් කිරීම වැනි සංකීර්ණ කාර්යය සඳහා පුහුණුව ලැබූ විමර්ශන කාර්ය මණ්ඩලයට දෙපාර්තමේන්තුව තුළින් ඉවත්වීමට ඉඩ ලැබීම ආදී ගැටළු මෙන්ම පුද්ගලික ඉඩම් පිළිබඳ හිමිකම් තීරණය කිරීමේදී මතුව ඇති අනපේක්ෂිත ගැටළුද හේතු වූ බව පෙනී යයි.

2019 වසරේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සතුටුවිය හැකි අතර පසෙක තැබූ ගොනු සම්බන්ධව ගත් ක්‍රියාමාර්ගයන්හි ධනාත්මක ප්‍රතිඵල ලැබිණි. මැනුම් කටයුතු නිම කරන ලද ඉඩම් කැබලි සංඛ්‍යාවට සාපේක්ෂව ප්‍රගතිය ඉහළ අගයක රඳවා ගැනීමට හැකිවීම ද සතුටට කරුණකි.

ශ්‍රී ලංකාව දීර්ඝ ඉතිහාසයක් සහිත ඒ නිසාම ඉඩම් හිමිකම් පිළිබඳ සංකීර්ණ නීති සම්ප්‍රදායන්, භාවිතයන්ගෙන් මෙන්ම විචිත්‍ර ආකල්පයන්ගෙන් යුත් ජනතාවක් සහිත රටකි. එබැවින්ම ගැටළුකාරී සංකීර්ණ තත්ත්වයන් අවම කර ගනිමින් හා හිමිකම් නිරවුල් කර ගැනීමට ප්‍රමුඛතාව ලැබෙන ලෙස හිමිකම් ලියාපදිංචි කිරීමේ (බිම් සවිය) වැඩසටහන සැලසුම් කිරීමේ අවශ්‍යතාව ද දකිමි.

වැඩ සටහන සාර්ථක කර ගැනීම සඳහා සර්වේයර් ජනරාල් හා අතිරේක සර්වේයර් ජනරාල් (භි.ලි.ප.) ඇතුළු ඔහුගේ කාර්යය මණ්ඩලය දෛනිකව දෙනු ලබන අනගි සහය නොවන්නට මෙතරම් හෝ දුරක් ගමන් කිරීම දුෂ්කර වනු ඇත. ඔහුටත් එම දෙපාර්තමේන්තුවටත් මේ අවස්ථාවේ කෘතඥතාවය පළ කළ යුතුය. රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවෙන් වැඩ සටහන සම්බන්ධීකරණය කළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්, සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (භි.ලි.ප.) හා කාර්ය මණ්ඩලයටත්, බිම් සවිය වැඩ සටහනේ අවශ්‍යතාවය හොඳින් වටහාගත් ඒ සඳහා විශාල ධෛර්යයක් දුන් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ගරු ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ නියෝජ්‍ය අමාත්‍යතුමාත් පසුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා, රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමා ඇතුළු කාර්ය මණ්ඩලවලටත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය වෙනුවෙන් ධෛර්යයෙන්, කැපවීමෙන් වැඩකළ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරුන් තිදෙනා ඇතුළු සියළුම ප්‍රධාන කාර්යාලයේ හා ක්ෂේත්‍රයේ නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන් ඇතුළු නිලධාරී සැමටත් මගේ කෘතවේදීත්වය පළ කරමි.

පී.එම්.එච්.ප්‍රියදර්ශනී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්

## පටුන

පරිච්ඡේදය 01........................................................1

ආයතනික පැතිකඩ ........................................................1

1.1 හැඳින්වීම........................................................1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු ........................................................2

1.3 කාර්යයන්........................................................3

1.4 සංවිධාන සටහන........................................................4

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ........................................................4

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල් ........................................................5

1.7 විදෙස් ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ........................................................5

පරිච්ඡේදය 02........................................................6

ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........................................................6

පරිච්ඡේදය 03........................................................7

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ........................................................7

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය........................................................7

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය........................................................9

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ........................................................10

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්........................................................11

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ........................................................12

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........................................................12

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 13

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය........................................................14

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව ........................................................14

පරිච්ඡේදය 04........................................................15

කාර්ය සාධනය දර්ශක........................................................15

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක ........................................................15

පරිච්ඡේදය 05........................................................16

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ........................................................16

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ........................................................16

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ........................................................16

පරිච්ඡේදය 06........................................................17

මානව සම්පත් පැතිකඩ ........................................................17

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........................................................17

6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟයෙහි/ අතිරික්තයෙහි බලපෑම 17

6.3 මානව සම්පත් සංවර්ධනය ........................................................18

පරිච්ඡේදය 07........................................................22

අනුකූලතා වාර්තාව ........................................................22

## ඇමුණුම්

***01.*** ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව - නිරවුල් කිරීමේ නිලධාරීන් / කොමසාරිස්වරුන්ගේ / කොමසාරිස් ජනරාල්වරුන්ගේ නාම ලේඛනය

***02.*** ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන

***03.*** *විගණකාධිපතිවරයාගේ වාර්තාව*

# 2019 මුදල් වර්ෂය සඳහා
# ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ
# කාර්ය සාධන වාර්තාව

## පරිච්ඡේදය 01
## ආයතනික පැතිකඩ

### 1.1 හැඳින්වීම

**දෙපාර්තමේන්තු ඉතිහාසය**

ඉඩම් නිරවුල් කිරීම යනු රජයේ ඉඩම් පුද්ගලික ඉඩම් මොනවාද යන්න තීන්දු කර පුද්ගලික ලෙස තීන්දු කළ ඉඩම් අදාල උරුමකරුවන් වෙත පුද්ගලික අයිතියට පවරා දීමත් එම ඉඩම් සඳහා ඔවුනට පිඹුරුපතක් නිකුත් කිරීමත් රජය සතු ඉඩම් රජය වෙත පවරා දීමත්ය. මෙවැනි ක්‍රියාවලියක් මේ රටට අවශ්‍ය වූයේ යම්කිසි ඓතිහාසික පසුබිමක් පදනම් කරගෙනය. වසර දහස් ගණනක් තිස්සේ මේ රටේ ජනතාව ඉඩම් භුක්ති විඳීමත්, පරිහරණය කිරිමත් කළ ද ඔවුන්ට එම ඉඩම්වල අයිතිය පවරා දිමක් සිදු නොවීය. ඉඩම්වල හිමිකම සනාථ කළ හැකි ඔප්පු තිරප්පු වැනි ලිඛිත සාක්ෂි කිසිවක් ඔවුන්ට නොවීය. මෙවැනි තත්ත්වයක් යටතේ 1840 බ්‍රිතාන්‍ය පාලකයින් විසින් අංක 12 දරන අනවසර ඉඩම් ආඥා පනත ප්‍රකාශයට පත් කරන ලදී.

මුලික වශයෙන් එම ආඥා පනතින් ප්‍රකාශ කරන ලද්දේ යම්කිසි පුද්ගලයකුට තම ඉඩම තමාට අයත් බව සනාථ කිරීමට නොහැකි වන්නේ නම්, එම ඉඩම රාජ සන්තක වන බවයි. මිනිසුන්ගේ පරම්පරාගත භුක්තිය හා වගාව බ්‍රිතාන්‍ය පාලකයින් විසින් සැලකිල්ලට නොගන්නා ලදී. ඔවුන් අදහස් කලේ අයිතිය සනාථ කිරිම ඔප්පු, තිරප්පු, සන්නස් වැනි ලිඛිත සාක්ෂි මඟින් කළ යුතු බවයි. මෙම තත්ත්වය යටතේ 1840 අනවසර ඉඩම් ආඥා පනත නිසා මිනිසුන්ගේ ඉඩම් අක්කර දහස් ගණනින් ඔවුනට අහිමි විය. ලංකාවේ ජනතාවට සිදු වූ මෙම අසාධාරණය පිළිබඳව එවකට සිටි ලංකාවේ දේශීය නායකයින් සිය විරෝධතාවය හා කනස්සල්ල ප්‍රකාශ කරන ලදී. මේ අනුව මෙම ගැටලුවට විසඳුමක් වශයෙන් රජයේ ඉඩම් මොනවාද පුද්ගලික ඉඩම් මොනවාද යන්න තීන්දු කිරීමේ නිරවුල් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට බ්‍රිතාන්‍ය පාලකයින්ට සිදු විය. ඒ අනුව 1897 දී මුඩු බිම් ආඥා පනත ආරම්භ කරන ලදී. මුලින් දිසාපතිවරුන් හා විශේෂ නිලධාරින් විසින් ක්‍රියාත්මක කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය 1903 දී ස්ථාපිත කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතට පත් කරන ලදී. මුඩුබිම් ආඥා පනත ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ අඩුපාඩු හා ඉන් ජනතාවට සිදු වූ අසාධාරණකම් නැති කර ගැනීමේදී වඩාත් නිවැරදිවූත් නීත්‍යානුකූලවූත් නිරවුල් කිරීමේ ක්‍රියාවලියක් සිදු කිරීම සඳහා 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත ආරම්භ කරන ලදී.

දෙපාර්තමේන්තුවට අදාළ වූ මෙම ඉඩම් නිරවුල් කිරීමේ කාර්යය එසේම පවතින අතරතුරදී 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සම්මත වීම මත ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යයටද අවතීර්ණ විය. රජයේ සහ පුද්ගලික ඉඩම් වල අයිතිය තහවුරු

කිරීම තුළින් දියුණු ඉඩම් කළමනාකරණ ක්‍රමයක් ඇති කිරීමත් ඉඩම් හා සම්බන්ධ වංචා, දූෂණ අවම කිරීමත් මෙහි ප්‍රමුඛ අරමුණ වේ. එමෙන්ම එකී කාර්ය භාරය වර්තමානය වන විට දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්ය භාරය බවට පත්වී ඇත.

**1903 සිට 2019 දක්වා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නාම ලේඛනය**
*(ඇමුණුම් අංක 01 හි දක්වා ඇත)*

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

### දැක්ම

**සෑම ඉඩමකටම නිරවුල් හිමිකමක්**

### මෙහෙවර ප්‍රකාශය

**ඉඩම් නිරවුල් කිරීමේ හා හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාදාමය තුළින් රජයේ හා පෞද්ගලික ඉඩම් අයිතිය තීරණය කොට, සෑම බිම් කොටසකම හිමිකම තහවුරු කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ දියුණු ඉඩම් කළමනාකරණ ක්‍රමයකට දායක වීම.**

### අරමුණු

1. ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ රජයේ සහ පුද්ගලික ඉඩම් අයිතිය තීරණය කිරීම.
2. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ උරුම අයදුම්පත් කැඳවීම, විමර්ශන කටයුතු සිදුකිරීම සහ හිමිකම් තීරණය කිරීම ඇතුළු අනෙකුත් කටයුතු කිරීම.
3. ආයතනික හැකියාව ශක්තිමත් කිරීම මඟින් හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු හා ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම.
4. මනා ක්‍රියාකාරිත්වයකින් යුත් හිමිකම් විමර්ශන කාර්යාල ප්‍රාදේශීය මට්ටමින් පවත්වාගෙ යාම මඟින් හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම.
5. හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතුවල සියලු අවස්ථාවන් සඳහා මහජන සහයෝගය ලබා ගැනීම සහ මහජන විශ්වාසය තහවුරු කරගැනීමට කටයුතු කිරීම.
6. ඉඩම් අයිතිය පිළිබඳ කාර්යක්ෂම සහ විශ්වාසනීය තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
7. කාර්යක්ෂම පරිපාලන සහ ගිණුම් ක්‍රම පවත්වාගෙන යාම.

## 1.3 කාර්යයන්

දෙපාර්තමේන්තුව සතු මූලික කාර්යයන් පහත දැක්වේ.

- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු, ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සහ කාර්යාලීය පරිපාලනය කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ක්‍රමවේදයන් සහ පටිපාටි හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.

- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමට අදාළ කටයුතු වන,

  අ) ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

  ආ) උරුම අයදුම්පත් කැඳවීම

  ඇ) හිමිකම් විමර්ශන පැවැත්වීම

  ඈ) හිමිකම් තීරණය කිරීම

  ඉ) හිමිකම් තීරණය ගැසට් කිරීම යනාදිය ඉටු කිරීම.

- ඉඩම් නිරවුල් කිරීමට අදාළ කටයුතු වන,

  අ) නිරවුල් කිරීමේ උරුම විභාග පැවැත්වීම

  ආ) නිරවුල් කරන ලද ඉඩම් මැන වෙන් කිරීමට යැවීම

  ඇ) නිරවුල් කිරීමේ ආඥා ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීම

  ඈ) නිරවුල් කිරීමෙන් පසු ගම් නිදහස් කිරීම යනාදිය ඉටු කිරීම.

- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු වලදී අදාළ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම.

- කාර්ය මණ්ඩලයේ රාජකාරි කාර්යක්ෂමව සිදුකිරීමට අවශ්‍ය පුහුණුව සහ අනෙකුත් සම්පත් අවශ්‍යතා හඳුනාගෙන ඒවා සපයා දීම.

- හිමිකම් විමර්ශනය සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සඳහා කාර්ය සාධන දර්ශක සැකසීම සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතුවල ප්‍රගතිය මාසිකව අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.

- ඉඩම් නිරවුල් කිරීමට අදාළ පැරණි සහ වටිනා ලේඛන සංරක්ෂණය කිරීම සඳහා කාර්යක්ෂම ලේඛන සංරක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාම.

- හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ මහජන අවබෝධය වර්ධනය කිරීම සහ සහයෝගය ලබා ගැනීම පිණිස දැනුවත් කිරීමේ රැස්වීම්, සාකච්ඡා සහ වැඩමුළු පැවැත්වීම.

- ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම සහ ඔවුන්ට අවශ්‍ය සම්පත් ලබාදීම මඟින් මහජන අවශ්‍යතා සපුරා ගැනීමට අවකාශ සැලසීම.

- වාර්ෂික ඇස්තමේන්තු, විසර්ජන ගිණුම්, රජයේ නිලධාරින්ගේ ඇස්තමේන්තු ගිණුම් සහ මාසික ගිණුම් සාරාංශ සැකසීම.

## 1.4 සංවිධාන සටහන

*(ඇමුණුම් අංක 02 හි දක්වා ඇත)*

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- හිමිකම් නිරවුල් කිරීමේ අංශය
- ඉඩම් නිරවුල් කිරීමේ අංශය

### දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය කාර්යාලය |
|---|---|
| ගම්පහ | දිවුලපිටිය |
| | මිනුවන්ගොඩ |
| | මීරිගම I/II |
| | මහර |
| | අත්තනගල්ල |
| | දොම්පේ |
| | ගම්පහ |
| | ජා ඇල |
| | වත්තල |
| | කටාන |
| රත්නපුර | බලංගොඩ |
| | වැලිගෙපොල |
| | රත්නපුරය |
| | නිවිතිගල |
| | කුරුවිට |
| කොළඹ | හෝමාගම |
| | මොරටුව |
| | කැස්බෑව |
| | රත්මලාන |
| | දෙහිවල |
| මහනුවර | දොළුව/උඩපළාත |
| | යටිනුවර |
| | උඩුනුවර |
| | හාරිස්පත්තුව |
| | ගඟවටකෝරලේ |
| නුවරඑළිය | කොත්මලේ |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය කාර්යාලය |
| --- | --- |
| අනුරාධපුරය | තඹුත්තේගම |
| | තලාව |
| | රාජාංගනය |
| | නැගෙනහිර නුවරගම් පළාත |
| හම්බන්තොට | ලුනුගම්වෙහෙර |
| | තිස්සමහාරාමය |
| | හම්බන්තොට |
| | බෙලිඅත්ත |
| කුරුණෑගල | රිදීගම |
| | මල්ලව පිටිය |
| | කුරුණෑගල |
| | පන්නල |
| | වාරියපොල |
| මොණරාගල | සියඹලාණ්ඩුව |
| බදුල්ල | රිදීමාලියද්ද |
| | මහියංගනය |
| පොළොන්නරුව | මැදිරිගිරිය |
| | හිඟුරක්ගොඩ |
| මාතලේ | දඹුල්ල |
| | ගලේවෙල |
| පුත්තලම | වෙන්නප්පුව |
| | පුත්තලම |
| කළුතර | පානදුර |
| | හොරණ |
| | කළුතර |
| ගාල්ල | ගාල්ල |
| | හික්කඩුව |
| | ඇල්පිටිය |
| මාතර | වැලිගම |
| | මාතර |
| කෑගල්ල | ගලිගමුව |
| යාපනය | නල්ලූර් |

## 1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

අදාල නොවේ.

## 1.7 විදෙස් ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අදාල නොවේ.

## පරිච්ඡේදය 02
## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2019 වර්ෂයේදි 12 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිතියම් 399ක ඉඩම් කැබලි 58,016ක් මැනුම් සිදු කර අප දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති අතර කැබලි 51,903ක් සම්බන්ධයෙන් 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ ලබා දීමට දෙපාර්තමේන්තුව සමත්වී ඇත. මෙය 2018 වර්ෂයේදී පිළිවෙලින් සිතියම් 527ක ඉඩම් කැබලි 85,994ක් හා 61,226 ක් වේ. එමෙන්ම පනතේ 14 වගන්තිය යටතේ වන තීරණ අතුරින් මෙම වර්ෂයේදි ඉඩම් කැබලි 58,473ක් ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර ඇති අතර ඉඩම් කැබලි 49,963ක් හා සම්බන්ධ උපලේඛන හිමිකම් ලියාපදිංචිය සඳහා සහ හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත යොමු කොට ඇත. හිමිකම් ප්‍රකාශිත ගැසට් නිවේදනය පිළිබඳ විරෝධතාවක් ඇතොත් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි මාසයක කාල පරාසයකින් පසු හිමිකම් සහතික සැකසීම සඳහා රෙජිස්ට්‍රාර් කාර්යාලවලට යොමු කරන ලද අතර 2020 වර්ෂය සඳහා අපේක්ෂිත ඉලක්කය 124,000 බවද සඳහන් කරමි.

| | |
|---|---|
| ......................................... | පී. එම්. එච්. ප්‍රියදර්ශනී ......................................... |
| ප්‍රධාන ගණන් දීමේ නිලධාරි | ගණන් දීමේ නිලධාරි |
| නම : | නම : |
| තනතුර : | තනතුර : |
| දිනය : 2020/06/24 | දිනය : 2020.06.24 |
| ආර්. ඒ. ඒ. කේ. රණවක<br>ලේකම්<br>ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය<br>"මිහිකත මැදුර" ඉඩම් මහලේකම් කාර්යාලය<br>අංක. 1200/6, රජමල්වත්ත පටුමග,<br>බත්තරමුල්ල. | පී. එම්. එච්. ප්‍රියදර්ශනී<br>ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් හා<br>නිරවුල් කිරීමේ නිලධාරි<br>ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව<br>අංක. 1200/6, "මිහිකත මැදුර"<br>රජමල්වත්ත පාර, බත්තරමුල්ල. |

## පරිච්ඡේදය 03
## වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | 2018 | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 520,704,648 | 462,203,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 4,566,684 | 3,803,792 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 21,369,773 | 21,194,082 | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| - | වෙනත් ලැබීම් | | 25,658,075 | 17,882,286 | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 572,299,180 | 505,083,160 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 572,299,180 | 505,083,160 | |
| | අඩුකළා : වියදම් | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| - | පුනරාවර්තන වියදම් | | - | - | |
| - | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 399,573,913 | 367,317,428 | |
| - | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 17,113,645 | 15,216,634 | ඒසීඒ-2(ii) |
| - | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 7,870,198 | 7,493,542 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| - | මුළු පුනරාවර්තන වියදම් (ඇ) | | 424,557,756 | 390,027,604 | |
| | මූලධන වියදම් | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 2,577,615 | 1,574,183 | |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 1,215,006 | 1,984,698 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| - | හැකියා වර්ධනය | 14 | 603,023 | 992,577 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| - | මුළු මූලධන වියදම් (ඉ) | | 4,395,644 | 4,551,458 | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | 29,048,362 | 25,127,901 | |
| | තැන්පතු ගෙවීම් | | 4,865,519 | 3,824,269 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 24,182,843 | 21,303,632 | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| | මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ) | | 458,001,762 | 419,706,962 | |
| - | ..........දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ) | | 114,297,418 | 85,376,198 | |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

### 2019 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තතය 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 249,427,012 | 110,550,706 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 52,366,104 | 49,553,033 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 2,657,546 | - |
| මුළු වත්කම් | | 304,450,662 | 160,103,739 |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වත්කම් | | 52,366,104 | 49,254,198 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 249,427,012 | 110,550,706 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | 298,835 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 2,657,546 | - |
| මුළු වගකීම් | | 304,450,662 | 160,103,739 |

පිටු අංක 05 සිට 24 දැක්වෙන ඉහත ඒසීඒ 1සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ සටහන් පිටු අංක 25 සිට 32 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | පී. එම්. එච්. ප්‍රියදර්ශනී | ........................ |
| ප්‍රධාන ගණන් දීමේ නිලධාරි | ගණන් දීමේ නිලධාරි | ප්‍රධාන ගණකාධිකාරි |
| නම : | නම : | නම : එන්. පී. තෙන්නකෝන් |
| තනතුර : | තනතුර : | දිනය : 2020.06.24 |
| දිනය : 2020/06/24 | දිනය : 2020.06.24 | |

ආර්. ඒ. ඒ. කේ. රණවක
ලේකම්
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
"මිහිකත මැදුර" ඉඩම් මහලේකම් කාර්යාලය
අංක. 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

පී. එම්. එච්. ප්‍රියදර්ශනී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්

එන්. පී. තෙන්නකෝන්
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
අංක. 1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

## 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

### 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සතය<br>2019<br>රු. | <br>2018<br>රු. |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 25,658,076 | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 520,704,648 | 462,329,338 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 546,362,724 | 462,329,338 |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 414,611,772 | 432,011,469 |
| සහනාධාර සහ මාරුකිරීම් | 7,870,198 | 7,493,542 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 118,448,982 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 540,930,952 | 439,505,011 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | 5,431,772 | 22,824,327 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | 318,658 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 18,207,488 | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | 18,207,488 | 318,658 |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 3,395,644 | 4,730,742 |
| අත්තිකාරම් ගෙවීම් | 17,287,235 | 14,753,184 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 20,682,879 | 19,483,926 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | (2,475,391) | (19,165,268) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | 2,956,381 | 3,659,059 |

| | | |
|---|---|---|
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 4,566,684 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | 4,566,684 | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 4,865,519 | (3,659,059) |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | 4,865,519 | (3,659,059) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | (298,835) | 3,659,059 |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ) | 2,657,546 | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

| වාර්තාකිරීමේ පදනම | |
|---|---|
| 1) | වාර්තාකරණ කාලපරිච්ඡේදය |
| | 2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ. |
| 2) | මිනුම්කරණ පදනම |
| | මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. |
| | මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත. |
| 3) | ආදායම් හඳුනාගැනීම |
| | හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ. |
| 4) | දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම |

| | |
|---|---|
| | වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. |
| | දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී. |
| 5) | දේපළ, පිරියත හා උපකරණ සංචිතය |
| | මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ. |
| 6) | මුදල් හා මුදල් සමාන දෑ |
| | 2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ. |

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

අදාල නොවේ.

## 3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 421,000,000.00 | 443,060,000.00 | 424,557,755.72 | 95.8% |
| ප්‍රාග්ධන | 5,500,000.00 | 5,500,000.00 | 4,395,644.00 | 79.9% |

### 3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණු | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| **01** | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය **(122)** | **2509 -** බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය කාර්යාල **43**ක පරිපාලන වියදම් දැරීමට | **84,000,000.00** | **116,000,000.00** | **112,094,060.86** | **96.6%** |
| **02** | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය **(122)** | **2105 -** බිම්සවිය කාර්යාල වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීම වාහන වැඩිදියුණුව වෙනුවෙන් භාණ්ඩ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා | **26,000,000.00** | **12,000,000.00** | **8,562,070.29** | **71.3%** |

## 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | **36,400,000.00** | - | **100%** |
| **9152** | යන්ත්‍රෝපකරණ | - | **213,027,012.00** | - | **100%** |
| **9153** | ඉඩම් | - | - | - | - |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| **9155** | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| **9160** | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| **9180** | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

***2019.12.31 දිනට අදාළව භාණ්ඩ සමීක්ෂණ කටයුතු ශාඛා කාර්යාල වල සිදු වෙමින් පවතී.***

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**(ඇමුණුම් අංක 03 හි දක්වා ඇත)**

# පරිච්ඡේදය 04
# කාර්ය සාධනය දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිෂතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 12 වගන්තිය යටතේ ගැසට් කිරීම. | 89.53 % | | |
| බෙදා දුන් හිමිකම් අයදුම්පත් ගණන | 97.94% | | |
| හිමිකම් විමර්ශන පැවැත්වීම. | 209.71 % | | |
| ඉ.රෙ.පරීක්ෂණ පැවැත්වීම. | 100.23% | | |
| 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම. | 99.81% | | |
| 14 වගන්තිය යටතේ ගැසට් කිරීම. | 114.65% | | |
| හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම. | 108.61% | | |

## පරිච්ඡේදය 05
## තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්කය | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% -100% |
| ස්ත්‍රී පුරුෂ භාවය සහා හිමිකම් මාදිලියට අනුව, නීත්‍යානුකූලව පිළිගත් ලිපි ලේඛන සහ සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය | හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම | 12 වගන්තිය යටතේ ගැසට් කිරීම | | | 89.53 % |
| | | බෙදා දුන් හිමිකම් අයදුම්පත් ගණන | | | 97.94% |
| | | හිමිකම් විමර්ශන පැවැත්වීම | | | 209.71 % |
| | | ඉ.රෙ.පරීක්ෂණ පැවැත්වීම | | | 100.23% |
| | | 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම | | | 99.81% |
| | | 14 වගන්තිය යටතේ ගැසට් කිරීම | | | 114.65% |
| | | හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම | | | 108.61% |

### 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- බිම්සවිය වැඩසටහනේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට දෙපාර්තමේන්තුව සතු මානව සම්පත් ප්‍රමාණවත් නොවීම.
- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සඳහා සංශෝධන ඇතුළත් කිරීමට පියවර ගැනීම.
- ප්‍රාදේශීය කාර්යාල අතර සම්බන්ධීකරණය ඉහළ නැංවීමට දිස්ත්‍රික් කාර්යාල ස්ථාපනය කිරීමට කටයුතු ආරම්භ කිරීම.

## පරිච්ඡේදය 06
## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | **105** | **28 + 16*** | **75** |
| තෘතීයික | **7** | **6 + 1*** | **1** |
| ද්විතියික | **1746** | **633** | **1113** |
| ප්‍රාථමික | **380** | **142** | **112** |

* කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන් වේ.
** සහකාර කොමසාරිස්වරුන්ගේ, සහකාර විමර්ශන නිලධාරීවරුන්ගේ, කළමනාකරණ සේවා නිලධාරීවරුන්ගේ සහ කාර්යාල කාර්ය සහායකවරුන්ගේ මානව සම්පත් හිඟයක් පවතී. එම තත්වය දෙපාර්තමේන්තුවේ සමස්ත ක්‍රියාවලියට බලපා ඇත.

### 6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟයෙහි/ අතිරික්තයෙහි බලපෑම

ප්‍රධාන කාර්යාලයේ සහකාර කොමසාරිස් (විමර්ශන) මිය වැඩ බැලීම සඳහා වැලිගෙපොල හා බලංගොඩ කාර්යාල දෙකටම යොදා ඇත. ගඟවටකෝරලය සහකාර කොමසාරිස්වරිය උඩුනුවර ප්‍රාදේශීය කාර්යාලයේ වැඩබැලීම සඳහා ද, මාතර සහකාර කොමසාරිස්වරිය බෙලිඅත්ත ප්‍රාදේශීය කාර්යාලසේ වැඩබැලීම සඳහා ද, වැලිගම සහකාර කොමසාරිස් තුමා තිස්සමහාරාමය ප්‍රාදේශීය කාර්යාලයේ වැඩබැලීම සඳහා ද, කුරුවිට සහකාර කොමසාරිස් තුමා රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ වැඩබැලීම සඳහා ද, පුත්තලම සහකාර කොමසාරිස් තුමා වෙන්නප්පුව ප්‍රාදේශීය කාර්යාලයේ වැඩබැලීම සඳහා ද, මල්ලවපිටිය සහකාර කොමසාරිස් තුමා රිදීගම ප්‍රාදේශීය කාර්යාලයේ වැඩබැලීම සඳහා ද පත් කර ඇති අතර ගලේවෙල හා දඹුල්ල ප්‍රාදේශීය කාර්යාල, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් ද වැඩ බැලීමට යෙදවීම නිසා ඔවුන්ගෙන් දෙපාර්තමේන්තුවට ලබා ගත යුතු පූර්ණ සේවාව ලබා ගැනීමට නොහැකි වී ඇත.

ප්‍රධාන කාර්යාලය සඳහා කළමනාකරණ සේවාවේ පුරප්පාඩු 8ක් පමණ ද, ප්‍රාදේශීය කාර්යාලවල අවම වශයෙන් කටයුතු පවත්වා ගැනීම සඳහා 10 දෙනෙකුවත් යෙදවීම අවශ්‍යාව ඇත. එසේම කාර්යාල කාර්ය සහායකවරුන්ගේ පුරප්පාඩු 12ක් පමන පවතින අතර සහකාර හිමිකම් විමර්ශන නිළධාරින්ගේ 150ක් පමණ පුරප්පාඩු පවතී. මේ තත්වය දෙපාර්තමේන්තුවේ සමස්ථ ක්‍රියාවලියට බලපා ඇති බව වාර්තා කරමි.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ අයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Training Programme on New CIGAS for year 2019 | 1 | 2019/01/31 | | | දේශීය | |
| සිංහල භාෂා පාඨමාලාව | 1 | 2019/02/05 සිට මාස 03ක කාලයක් | | | දේශීය | සිංහල භාෂා ප්‍රවීනතාවය |
| ප්‍රවාහන කළමනාකරණය - දෙදින වැඩමුළුව | 1 | 2019/02/28 සිට 2019/03/01 | 7,000.00 | | දේශීය | ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ |
| ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන | 2 | 2019/03/14 සිට 2019/03/15 දක්වා | | | දේශීය | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ |
| ගබඩා කළමනාකරණය හා රාජ්‍ය වත්කම් බැහැර දීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 1 | 2019/03/07 සිට 2019/03/08 දක්වා | 8,500.00 | | දේශීය | ගබඩා කළමනාකරණය හා රාජ්‍ය වත්කම් බැහැර දීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ |
| වැටුප් පරිවර්ථනය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව | 4 | 2019/03/18 සිට 2019/03/19 දක්වා | 34,000.00 | | දේශීය | වැටුප් පරිවර්ථනය පිළිබඳ |
| රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 3 | 2019/04/01 | | | දේශීය | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ |
| විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව | 4 | 2019/05/14 | 20,000.00 | | දේශීය | විශ්‍රාම වැටුප් සැකසීම පිළිබඳව |
| බඳවා ගැනීමේ පටිපාටිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 2 | 2019/05/27 සිට 2019/05/28 දක්වා | 17,000.00 | | දේශීය | බඳවා ගැනීමේ පටිපාටිය පිළිබඳ |
| රාජ්‍ය නිලධාරීන් සඳහා වන නේවාසික නොවන දින 06 දෙමළ භාෂා පාඨමාලාව | 2 | 2019/06/07 සිට 2019/06/12 | | | දේශීය | දෙමළ භාෂාව පිළිබඳව |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ අයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස රාජ්‍ය නිලධාරින් සඳහා පවත්වන දින 12 අනේවාසික දෙවන භාෂා පුහුණු පාඨමාලාව | 1 | 2019/06/21 සිට 2019/06/26 | | | දේශීය | දෙමළ භාෂාව පිළිබඳව |
| කාර්යාල ක්‍රම,ලිපිගොණුකරණය, මුදල් රෙගුලාසි,ගිණුම්කරණය පිළිබඳ වැඩමුළුව | 40 | 2019/06/21 සිට 2019/06/23 | 225,723.25 | | දේශීය | කාර්යාල ක්‍රම,ලිපිගොණුකරණය, මුදල් රෙගුලාසි,ගිණුම්කරණය පිළිබඳ |
| විගණන පනත පිළිබඳ වැඩමුළුව | 2 | 2019/06/25 | 20,000.00 | | දේශීය | විගණන පනත පිළිබඳ |
| මාණ්ඩලික නිලධාරින් සඳහා වන වැඩමුළුව | 2 | 2019/07/18 සිට 2019/07/20 | | | දේශීය | |
| නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම | 1 | 2019/07/25 සිට 2019/07/26 | 8,500.00 | | දේශීය | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම පිළිබඳව |
| ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ රාජ්‍ය නිලධාරින් දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන | 3 | 2019/07/25 සිට 2019/07/26 | | | දේශීය | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ |
| ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම | 1 | 2019/07/29 සිට 2019/07/30 | 8,500.00 | | දේශීය | ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම පිළිබඳව |
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ වැඩමුළුව | 123 | 2019/08/19 | 59,809.96 | | දේශීය | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ |
| Public Service Disciplinary Procedures | 1 | 2019/08/20 සිට 2019/08/22 | 18,000.00 | | දේශීය | රාජ්‍ය සේවයේ විනය පටිපාටිය පිළිබඳව |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේව-ක සං-ඛ්‍යාව | වැඩසටහ-නේ කාල සීමාව | සමස්ථ අයෝජනය (රු.) | | වැඩසටහ-නේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රජයේ නිලධාරින්ගේ "B" අත්තිකාරම් ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ වැඩමුළුව | 1 | 2019/08/23 | 8,500.00 | | දේශීය | රජයේ නිලධාරින්ගේ "B" අත්තිකාරම් ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ |
| රාජ්‍ය නිලධාරින් සඳහා වන නේවාසික නොවන දින 12 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 1 | 2019/08/23 සිට 2019/09/03 | | | දේශීය | දෙමළ භාෂාව පිළිබඳව |
| Workshop on Disciplinary Procedure | 2 | 2019/09/02 සිට 2019/09/04 | 30,000.00 | | දේශීය | රාජ්‍ය සේවයේ විනය පිටිපාටිය පිළිබඳව |
| Government Payroll System | 1 | 2019/09/02 සිට 2019/09/04 | 18,000.00 | | දේශීය | රාජ්‍ය සේවයේ වැටුප් පරිවර්තනය පිළිබඳව |
| අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 78 | 2019/09/06 | 67,911.00 | | දේශීය | අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ |
| අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 76 | 2019/09/12 | 114,176.50 | | දේශීය | අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ |
| අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 63 | 2019/09/20 | 64,379.00 | | දේශීය | අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ |
| විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව | 2 | 2019/09/23 | 10,000.00 | | දේශීය | විශ්‍රාම වැටුප් පිළිබඳව |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේව-ක සං-ඛ්‍යාව | වැඩසටහ-නේ කාල සීමාව | සමස්ථ අයෝජනය (රු.) | | වැඩසටහ-නේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 80 | 2019/10/11 | 58,550.00 | | දේශීය | අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ |
| අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 60 | 2019/10/18 | 74,625.00 | | දේශීය | අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ |
| අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 80 | 2019/10/25 | 71,970.66 | | දේශීය | අධිකරණ හා නෛතික ප්‍රතිපාදන,හිමිකම් ලියාපදිංචිය,මිනුම් කටයුතු පිළිබඳ |
| සමථකරණය, මිනුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 80 | 2019/12/06 | 51,500.00 | | දේශීය | සමථකරණය, මිනුම් කටයුතු පිළිබඳ |
| සමථකරණය, මිනුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 60 | 2019/12/13 | 81,419.97 | | දේශීය | සමථකරණය, මිනුම් කටයුතු පිළිබඳ |
| සමථකරණය, මිනුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 80 | 2019/12/20 | 82,119.97 | | දේශීය | සමථකරණය, මිනුම් කටයුතු පිළිබඳ |

## ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි පුහුණු වැඩසටහන් වල දායකත්වය

පුහුණු වැඩමුළු පැවැත්වීම තුළින් එක් එක් නිලධාරින්ගේ රාජකාරි පිළිබඳව හා විෂය පිළිබඳව දැනුම, කුසලතාවය හා අත්දැක්ම් ලබා ගැනීමට හැකි වන අතර එලෙස ලබා ගන්නා දැනුම,කුසලතාවය හා අත්දැකීම් රාජකාරි සිදු කිරීමේ දී ඉතා වැදගත් වේ.එනම් පුහුණු වැඩමුළු පැවැත්වීම ආයතනයක කාර්ය සාධනය හා ප්‍රගතිය සඳහා අත්‍යාවශ්‍ය වේ.

## පරිච්ඡේදය 07
## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 01 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශය | 2/28 දිනට දීමට නියමිත ය | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | 2/28 දිනට දීමට නියමිත ය | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |
| 02 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445) | අනුකූල වේ | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **2.5** | සියළුම මාසික ගිණුම් සාරාංශ **(CIGAS)** පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **2.6** | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.7** | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.8** | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.9** | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.10** | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.11** | උප පත්‍රිකා පොත් ලේඛනය **(GA-N20)** යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම **(මු.රෙ.135)** | අනුකූල වේ | | |
| **3.1** | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| **3.2** | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| **3.3** | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 04 | වාර්ෂික සැලසුම් සකස් කිරීම | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරිම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණක තනතුර 2019 වර්ෂය තුළ පුරප්පාඩුවී පැවතීම | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 05 | විගණන විමසුම | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 06 | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණක තනතුර 2019 වර්ෂය තුළ පුරප්පාඩුවී පැවතීම | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | සැලැස්ම සකස් කිරීම | | | |
| **6.2** | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | අමාත්‍යාංශයේ විගණක විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත | |
| **6.3** | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | | |
| **6.4** | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | | |
| **07** | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| **7.1** | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | කමිටු රැස්වීම් 02ක් පවත්වා තිබේ | |
| **08** | වත්කම් කළමනාකරණය | | | |
| **8.1** | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | තිබීම | | | |
| **8.2** | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| **8.3** | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක **05/2016** අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **8.4** | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| **8.5** | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **09** | වාහන කළමනාකරණය | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **9.1** | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිම | අනුකූල වේ | | |
| **9.2** | වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | පවතින නීතිමය තත්වයන් තුළ මෙම අපහරණ ක්‍රියාවලිය සිදු කර ගැනීමේ අපහසුව | |
| **9.3** | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| **9.4** | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **9.5** | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| **9.6** | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| **10.1** | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **10.2** | සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | නිරවුල් කර තිබීම | | | |
| **10.3** | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| **11.1** | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| **11.2** | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දි ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම් | | | |
| **12.1** | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| **12.2** | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| **12.3** | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | පොදු තැන්පත් ගිණුම | | | |
| **13.1** | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **13.2** | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | අග්‍රිම ගිණුම | | | |
| **14.1** | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| **14.2** | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **14.3** | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| **14.4** | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | ආදායම් ගිණුම | | | |
| **15.1** | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| **15.2** | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| **15.3** | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | මානව සම්පත් කළමනාකරණය | රාජ්‍ය අංශය සතු මානව සම්පත සැලසුම් සහගතව සංවිධානය කිරීම | දෙපාර්තමේන්තුවේ අරමුණු වලට ගැළපෙන පරිදි කාර්ය මණ්ඩල | අදාල නැත |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | | | සංවිධානය කර ඇත | |
| **16.1** | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | ජ්‍යෙෂ්ඨතා මට්ටම, තෘතීය මට්ටම, ද්විතීය මට්ටම, ප්‍රාථමික මට්ටම යන ආදිය පුරප්පාඩු පවතී | පවතින පුරප්පාඩු තුළ වැඩ කළමණාකරණය කර ගනිමින් පවත්වාගෙන යනු ලැබේ | කාර්ය මණ්ඩල සම්පූර්ණ කරගත යුතුව ඇත |
| **16.2** | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | රාජකාරි ලැයිස්තු ලබාදී ඇත | අනුකූලයි | අදාල නොවේ |
| **16.3** | **20.09.2017** දිනැති **MSD** චක්‍රලේඛ අංක **04/2017** ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | **2019.12.24** දින දක්වා දෙපාර්තමේන්තු පුරප්පාඩු විස්තර යවා ඇත | අනුකූලයි | අදාල නොවේ |
| **17** | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| **17.1** | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **17.2** | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **17.3** | තොරතුරු දැන ගැනීමේ පනතේ **08** වන හා **10** වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | | ඉදිරියේ දි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි |
| **18** | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| **18.1** | අංක **05/2008** හා **05/2018 (1)** දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | | ඉදිරියේ දි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි |
| **18.2** | එම චක්‍රලේඛයේ **2.3** ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | ඉදිරියේ දි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි |
| **19** | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **2/2018 - 6:5** ට අදාලව දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය **2020** ට අදාලව යතාවත් කිරීමට කටයුතු කරමින් පවතී | අනුකූලයි | අදාල නොවේ |
| **19.1** | **2018.01.24** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **02/2018** ඇමුණුම **02** ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | **2020** වර්ෂය සඳහා සෑම ක්ෂේත්‍රයකම නිලධාරීන් නියෝජනය වන පරිදි පුහුණු සැලැස්මක් සකස් කර ඇත | අනුකූලයි | අදාල නොවේ |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **19.2** | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය **12** කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | සංවිධානය කර ඇත | අනුකූලයි | අදාල නොවේ |
| **19.3** | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම **01** හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම අත්සන් කර තිබීම | **2020** වර්ෂය සඳහා සමස්ත කාර්ය මණ්ඩල සඳහා කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරමින් පවතී | අනුකූලයි | අදාල නොවේ |
| **19.4** | ඉහත චක්‍රලේඛයේ **6.5** ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | මේ සඳහා ස.කො. පාලන වෙත වගකීම පවරා ඇත | අනුකූලයි | අදාල නොවේ |
| **20** | විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම | වාර්ෂික විගණන විමසුම් වලදී පෙන්වා දෙනු ලබන අඩුපාඩු හා යෝජනා සම්බන්ධයෙන් නිවැරදි කිරීම් හා යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ | අනුකූලයි | අදාල නොවේ |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **20.1** | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | **2019** වර්ෂය සඳහා විගණන ඡේද ලැබී නොමැත | |

## ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

## නිරවුල් කිරීමේ නිලධාරින් / කොමසාරිස්වරුන්ගේ/ කොමසාරිස් ජනරාල්වරුන්ගේ නාම ලේඛනය

| | |
|---|---|
| 1903 – 1905 | ජේ.ජී. ෆ්‍රේසර් මහතා |
| 1906 | එච්.ඕ. ෆොක්ස් මහතා (වැ.බ.) |
| 1907 – 1912 | ජේ.ජී. ෆ්‍රේසර් මහතා |
| 1913 | එච්.ඕ. ෆොක්ස් මහතා |
| 1914 | ජේ.එම්. ඩේවිස් මහතා (වැ.බ.) |
| 1915 -1917 | එච්.ඕ. ෆොක්ස් මහතා |
| 1918 | ජේ.එම්. ඩේවිස් මහතා (වැ.බ.) |
| 1919 – 1920 | එච්.ඕ. ෆොක්ස් මහතා |
| 1921 | ඩබ්ලිව්.ඊ. වේට් මහතා |
| 1922 – 1923 | එම්.එම්. වෙදර්බර්න් මහතා (වැ.බ.) |
| 1924 | එම්.ටී. ආච්බල්ඩ් මහතා (වැ.බ.) |
| 1925 | එෆ්. බාට්ලට් මහතා |
| 1926 – 1927 | එම්.ටී. ආච්බල්ඩ් මහතා (වැ.බ.) |
| 1928 | එම්.ටී. ආච්බල්ඩ් මහතා |
| 1929 – 1930 | ඩබ්ලිව්.ටී. ස්ටේස් මහතා |
| 1931 – 1936 | එච්.ඊ. ජැන්ස් මහතා (වැ.බ.) |
| 1937 – 1939 | එච්.ඊ. ජැන්ස් මහතා |
| 1940 | සී.එල්. වික්‍රමසිංහ මහතා |
| 1941 – 1944 | එච්.ඊ. ජැන්ස් මහතා |
| 1945 – 1947 | සී.බී.පී. පෙරේරා මහතා (වැ.බ.) |
| 1948 – 1950 | සී.බී.පී. පෙරේරා මහතා |
| 1951 – 1954 | එම්.ඩබ්ලිව්.එෆ්. අබේකෝන් මහතා (වැ.බ.) |
| 1955 – 1958 | එම්.ඩබ්ලිව්.එෆ්. අබේකෝන් මහතා |
| 1959 | එස්.එල්. ද සිල්වා මහතා (වැ.බ.) |
| 1960 | ආර්.ටී. රත්නතුංග මහතා (වැ.බ.) |
| 1961 – 1963 | ආර්.ටී. රත්නතුංග මහතා |
| 1964 – 1974 | එස්.එල්. ද සිල්වා මහතා |
| 1975 – 1978 | සී.එස්. රණසූරිය මහතා |
| 1979 – 1980 | අයි.ඒ. එදිරිවීර මහතා |
| 1981 – 1983 | කේ.පී. විමලධර්ම මහතා |
| 1984 – 1987 | ආර්.ඩබ්ලිව්. පියසේන මහතා |
| 1988 | ඒ. බොරළුගොඩ මහතා (වැ.බ.) |
| 1989 | ඩී.ජී.පී. සෙනෙවිරත්න මහතා |
| 1990 – 1993 | ආර්.එම්.සී.පි. උඩුගම්පල මහත්මිය |
| 1994 | එච්. උඩකන්දගේ මහතා (වැ.බ.) |
| 1995 - 1997 | ආර්.එම්.සී.පි. උඩුගම්පල මහත්මිය |
| 1997 – 2001 | එච්. උඩකන්දගේ මහතා |
| 2002 – 2003 | එස්. එච්. විතානගේ මහතා |
| 2004 – 2005 | කේ.ඒ.ඩී.පි. පෝල් මහතා |
| 2006 – 2008 | පී.ඒ. මුතුකුමාරණ මහතා |
| 2009 – 2010 | ජී. විජිත නන්ද කුමාර් මහතා |
| 2011 | එල්.කේ. පේමරත්න මහතා |
| 2012 - 2013 | ඒ.එච්.එස්. විජේසිංහ මහතා |
| 2013 - 2015 | ගාමිණී ඉලංගරත්න මහතා |
| 2015 | ජී. විජිත නන්ද කුමාර් මහතා |
| 2015 - 2018 | කේ. ඒ. කේ. රංජිත් ධර්මපාල මහතා |
| 2019 සිට මේ දක්වා | පී.එම්.එච්. ප්‍රියදර්ශනී මහත්මිය |

# ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



**ජාතික විගණන කාර්යාලය**

**தேசிய கணக்காய்வு அலுவலகம்**

**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } ජ්ජීඑල්/ජ්/එල්එස්ඩී/2/2019/08 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූනි 30 දින

**කොමසාරිස් ජනරාල්,**
**ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව**

**ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එහි ඇතුළත් කළ යුතු සංඛ්‍යානමය අගයන් 2019 වසර සඳහා වූ භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනයේ අගයන් හා සැසඳී තිබිය යුතු බව දක්වා තිබුණත් එසේ නොසැසඳීම නිසා මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ දක්වා තිබූ රු.1,215,000 භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ වර්ෂයේ මිලදී ගැනීම් යටතේ රු.37,615,000 ක් ලෙස දක්වා තිබීමෙන් රු.36,400,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව - විෂය අංක 28701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම |  | ලැබීම් |  | හර ශේෂය |  |
| --- | --- | --- | --- | --- | --- |
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 22 | 17 | 16.5 | 18 | 105 | 52 |

අත්තිකාරම් ගිණුම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, විශ්‍රාමික, වැඩ තහනමට ලක්වූ සහ සේවය හැරගිය නිලධාරීන්ගේ අයවිම් නතර වූ ණය ශේෂවල 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.499,305 වූ අතර එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05ට වැඩි දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණු නමුත් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිසි අධ්‍යනයකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයන් දෙකකින් අධි ප්‍රතිපාදන සලකා තිබීම හේතුවෙන් රු.90,901 ක් හා රු.10,262 ක් එනම් ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක් හා සියයට 15 ක් ලෙස ඉතිරිවී තිබුණි.

(ආ) 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව මූලධන වියදම් වලින් සියයට 15 ක් හා සියයට 10 ක් පමණක් ඉතිරි කරගත යුතු බව දක්වා තිබුණද දෙපාර්තමේන්තුවේ සමස්ත මූලධන වියදම් ප්‍රතිපාදනය වූ රු.5,500,000 කින් ඉතිරිය රු.1,104,355 ක් වූ අතර එය සියයට 20 ක් පමණක් වී තිබුණි.

### 2.2 වත්කම් කළමනාකරණය

ගිණුම සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ රු.36,400,000 ක වටිනාකමකට දක්වා තිබූ නිල නිවාසය 2018 වර්ෂයේ ඉදිකර අවසන් කර තිබුණු නමුත් ඉඩමේ අයිතිය පවරාගෙන නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.3 හානි හා පාඩු

----------------

2011 වර්ෂයේ **HQ- 7234** දරන වාහනයට සිදු වූ අනතුරක් සම්බන්ධයෙන් අලුත්වැඩියා වියදම වූ රු. 22,250 ක් ගිණුම සමඟ ඉදිරිපත් කළ සටහන II හි මූ.රෙ.109 යටතේ වන පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය යටතේ ආරම්භක කපා නොහළ ශේෂය යටතේ ද කපා නොහළ ඉදිරියට ගෙන යන ශේෂය යටතේද පෙන්වා ඇති අතර මේ දක්වා පොත්වලින් කපාහැරීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

----------------------------------------------------

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

ආර්.එම්.රත්නායක
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

ආර්. එම්. රත්නායක
සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය